**ශ්‍රම වාසනා අරමුදල - 2016**

**------------------------------**

ශ්‍රම වාසනා අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනතේ 12(4) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 47 ඡේදය ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දිනට පැවති තොගය මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේදී රු. 2,422,800 ක් වටිනා ඇස්කණ්නාඩි 2692 ක් බෙදා දී තිබුණ ද, ඒවා බෙදාදීම පිළිබඳ තහවුරු කරගැනීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

#### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ සිට පැවත එන ගෙවිය යුතු රු. 140,000 ක නීති ආධාර මුදල් 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජාතික ලොතරැයි මණ්ඩලය මගින් ශ්‍රම වාසනා ලොතරැයි අලෙවි කිරීම වෙනුවෙන් පනතේ 13(3) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර කර තිබූ රු. 324,079,521 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. කෙසේ නමුත් මෙම මුදල් භාණ්ඩාගාරයෙන් ලබාදීමේදී අරමුදලේ ආදායම්, වියදම් ඇස්තමේන්තු හා කාර්යසාධන ප්‍රගතිය සමාලෝචනය කරමින් එම මුදල් නිදහස් කරන බැවින් එම සම්පූර්ණ මුදලම ලැබීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත<br>(i) 6 (අ) වන වගන්තිය | ප්‍රතිලාභ හිමි විය යුතු සේවානියුක්තිකයන් හඳුනාගැනීමට විධිමත් ක්‍රමවේදයක් කළමනාකරණය විසින් සකස් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) 13(1), 13(2) හා 13(3) වගන්ති | එක් එක් වර්ෂයේ දී පවත්වනු ලැබිය යුතු ලොතරැයි සංඛ්‍යාව හා ලොතරැයි වර්ග, ප්‍රදානය කෙරෙන තෑගි පිළිබඳව සහ හිමිකම් නොපෑ තෑගි සම්බන්ධයෙන් කටයුතු කෙරෙන ආකාරය හා ලොතරැයි වලින් ලැබෙන මුදල්, ප්‍රදානය කරනු ලබන තෑගි වල වටිනාකම හා ලොතරැයිය පැවැත්වීමේ වියදම් සම්බන්ධයෙන් ලොතරැයි මණ්ඩලය හා අරමුදල අතර එකඟතාවයන් ඇති කරගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 272 (1) හා (2) | වාහන අළුත්වැඩියා සඳහා ගෙවන ලද රු. 34,194 ක වියදමක් සම්බන්ධ වවුචරයක් අරමුදලේ අභ්‍යන්තර පාලන ක්‍රමයේ පවතින දුර්වලතා හේතුවෙන් අස්ථාන ගත වී තිබුණද ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 28,264,114 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 38,493,632 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 10,229,518 කින් පිරිහී තිබුණි. අරමුදලේ අරමුණු සඳහා වන වියදම් රු.11,438,200 කින් හා පරිපාලන වියදම් රු. 1,842,428 කින් ඉහළ යාම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.47,201,339 ක් වූ අරමුදලේ අතිරික්තය 2016 වර්ෂය වන විට රු. 28,264,114 ක් දක්වා අඛණ්ඩව පිරිහී තිබුණි. කෙසේ නමුත් මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වන ක්ෂය නැවත ගැලපීමේදී අරමුදලේ දායකත්වය 2012 වර්ෂයේදී රු.48,677,411 ක් වූ අතර එය 2013 වර්ෂයේදී රු. 59,390,283 දක්වා වර්ධනය වී තිබුණද 2014 වර්ෂයේ සිට දායකත්වය අඛණ්ඩව පහත වැටී සමාලෝචිත වර්ෂයේදී එය රු. 33,488,296 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

ලොතරැයි ආදායම වැඩිකර ගැනීම හා පනතේ අරමුණු පිළිබඳ සේවා නියුක්තිකයන් දැනුවත් කිරීම සඳහා ප්‍රවර්ධන හා ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දරා තිබූ වියදම් 2015 වර්ෂයේදී සියයට 641 කින්ද සමාලෝචිත වර්ෂයේදී සියයට 310 කින්ද වර්ධනය වී තිබුණි. එහෙත් ඊට සාපේක්ෂව ලොතරැයි ආදායමේ වර්ධනය 2015 වර්ෂයේ දී සියයට 4.54 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය සියයට 3.98 දක්වා අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

--------------

1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත ප්‍රකාරව අරමුදලේ ප්‍රධාන අරමුණු පහත පරිදි විය.

* සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම හා හදිසි අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

* සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක, ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

* සේවා නියුක්තිකයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

* ව්‍යසන අවස්ථා වලදී සේවා නියුක්තිකයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම.

* සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය සඳහා විශිෂ්ට සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රගති වාර්තාවන් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ කරුණු පහත පරිදි වේ.

(අ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 3.2 ක් වැයකර ඉටුකර ගැනීමට අපේක්ෂා කළ කෘතිම අත්පා බෙදාදීම හා වන්දි ප්‍රතිලාභ වැඩසටහන් 02 ක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නිම කළ යුතුව තිබූ වැඩසටහන් 09 ක් අතුරින් වැඩසටහන් 03 ක ප්‍රගතිය සියයට 02 සිට සියයට 10 දක්වා අඩු මට්ටමක පැවති අතර වැඩසටහන් 03 ක ප්‍රගතිය සියයට 50 සිට සියයට 70 අතර පැවතුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන තිබුණේද යන්න තහවුරු කර ගැනීමකින් තොරව හා ඉදිකිරීම් සඳහා සකස් කළ ඇස්තමේන්තුවක් ලබානොගෙන අරමුදලේ කළමනාකාරීත්වය විසින් රු.600,000 ක මුදලක් දැල්පන්දු පිටියක් සැකසීම සඳහා කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයට ලබා දී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

වැඩ බිමේදී හදිසි අනතුරකට මුහුණදී පාදයක් හෝ අතක් අහිමිවූ අය සඳහා කෘතිම පාදයක් හෝ අතක් ලබාදීම සඳහා “ වැඩ බිමේදී ආබාධිත වූ ඔබගේ ශ්‍රමයට සවියක් ” යන තේමාව යටතේ 2016 වර්ෂය තුළ දී වැඩසටහනක් පැවැත්වීම සඳහා දැන්වීම් පලකිරීමට පමණක් රු. 612,798 ක් වැයකර තිබුණද 2017 මාර්තු 30 දින වන විටත් එම වැඩසටහන පවත්වා නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

අරමුදල සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර 2013 නොවැම්බර් 12 දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පුරප්පාඩුව පැවතුණි. ඒ සඳහා නිලධාරියෙකු බඳවා ගෙන අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමට කළමනාකාරීත්වයේ අවධානය යොමුවී නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අයවැය ලේඛනමය පාලනය | අයවැයගත සංඛ්‍යා සහ තථ්‍ය සංඛ්‍යා අතර පවතින විචලතාවයන් අඩුකර අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබීම. |
| (ආ) | මෙහෙයුම් පාලනය | අරමුදල විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව වැඩසටහන් පැවැත්වීම. |
| (ඇ) | ගිණුම්කරණය | ගනුදෙනු ගිණුම්ගත කිරීමේදී මූලාශ්‍ර ලියවිලි භාවිතා කර නොතිබීම. |
| (ඈ) | තොග පාලනය | ආයතනයේ මිලදී ගැනීම් තොග ලේඛන වල සටහන් නොකිරීම හා එම ලේඛන යාවත්කාලීන නොකිරීම. |